රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 02/2021(VIII)

මගේ අංකය : EST-6/03/LEA/3381
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2023.05.12

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## <u>රාජ්‍ය සේවය සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2021.12.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2021(VI) වෙත ඔබේ කාරුණික අවධානය යොමු කරවන අතර, එමඟින් 2021.10.01 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2021(V)හි, කොවිඩ් - 19 වෛරස ව්‍යාප්තිය වැළැක්වීම සඳහා අනුගමනය කළ යුතු සෞඛ්‍ය මාර්ගෝපදේශ ඇතුළත් විධිවිධානයක් වන 07 ඡේදය ඒ ආකාරයෙන් ම තිබිය දී, 02, 03, 04, 05, 06, 08 සහ 14 ඡේදයන්හි විධිවිධාන 2022.01.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවා, රාජ්‍ය නිලධරයන් 2022.01.03 දින සිට සාමාන්‍ය පරිදි සේවයට කැඳවීමට ක්‍රියා කර ඇත.

02. ඒ අනුව, උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2021.10.01 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2021(V)හි 07 ඡේදයේ විධිවිධාන ද 2023.05.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවන අතර, එදින සිට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිත කිරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති, 2009.04.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2009 හා 2009.06.17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2009(I)හි විධිවිධාන ක්‍රියාත්මක විය යුතු බව මෙයින් අවධාරණය කරමි.

03. ඉහත විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම ආයතන ප්‍රධානීන් විසින් වග බලා ගත යුතු ය.

කේ.ඩී.එන්. රංජිත් අසෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 0112-699399
ෆැක්ස් : 0112-692158
විද්‍යුත් ලිපිනය : ade-vi@pubad.gov.lk

2023.05.12
2023/05/24